# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය



# වාර්ෂික වාර්තාව
# 2014

# පටුන

කොළඹ විශ්ව විද්‍යාලය....i
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය....ii
අරමුණු සහ පරමාර්ථ....iii
කළමනාකරණ මණ්ඩලය....iv
ඓතිහාසික පසුබිම....vi
අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය....vii

1. සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර....7
2. දේශීය සිසුන් පිළිබඳ විස්තර....7
3. විදේශීය සිසුන් පිළිබඳ විස්තර....8
4. විදේශීය සිසුන් පිළිබඳ විස්තර....8
5. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර....8
6. පර්යේෂණ නව්‍යකරණ සහ ප්‍රකාශන පිළිබඳ විස්තර....9
7. වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර....9
8. ලැබුණු සම්මාන පිළිබඳ තොරතුරු....9
9. ඇරඹූ නව පාඨමාලාවන් පිළිබඳ තොරතුරු....9
10. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර....10
11. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර....10
12. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක)....10
13. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක)....11
14. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)....11
15. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)....11
16. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2014....12
17. 2014 වසරේ ලැබුණු යටිතල පහසුකම් පිළිබඳ විස්තර....12
18. වෙනත් තොරතුරු....12
19. විගණන විමසුම් වාර්තා හා පිළිතුරු....19

# කොළඹ විශ්ව විද්‍යාලය

මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක

උප කුලපති

කොළඹ විශ්ව විද්‍යාලය

කේ.ඒ.එස් එඩ්වර්ඩ් මයා
රෙජිස්ට්‍රාර්
කොළඹ විශ්ව විද්‍යාලය

ඇමතුම්
කොළඹ විශ්ව විද්‍යාලය,
කුමාරතුංග මුනිදාස මාවත
කොළඹ 00300, කොළඹ
(+94) 112 581 835
(+94) 112 584 695
(+94) 112 585 509

<u>දැක්ම</u>

රටෙහි ප්‍රථම විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ඓතිහාසික සබැඳියාවන්ගෙන් ද උරුමයෙන් ලද බුද්ධිමය සම්ප්‍රදායයන්ගෙන් ද අභිප්‍රේරණය වූ කොළඹ විශ්ව විද්‍යාලය, රටෙහි බහුවාර්ගික සමාජයීය ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් ආරක්ෂා කරගනිමින් දැනුම, අධ්‍යාපනය, පර්යේෂණය, නිර්මාණශීලීත්වය සහ ව්‍යවසායකත්වයෙහි සහක්‍රියාකාරීත්වය තුළින් මානව සංවර්ධනය ප්‍රවර්ධනය කරන ලොව පිළිගත් ආයතනයක් වීමට ප්‍රයත්න දරයි.

<u>මෙහෙවර</u>

උසස් ආචාර ධර්ම සම්මතයන්ගෙන් සහ මනා සමාජයයී වගකීමකින් යුතුවූද , නව්‍ය අදහස් සහිත, නිවහල්, විශ්ලේෂණාත්මක චින්තනයෙන් යුතුවූ, ආර්ථීක-සමාජයීය, සංස්කෘතික සහ පාරිසරික සංවර්ධනයෙහි හවුල්කාරයන් බවට පත්වීමේ ශක්‍යතාවයෙන් සමන්විත මානව ප්‍රාග්ධනය සමාජයට සැපයීම සඳහා අචල බැඳීමක් සහ කැපවීමක් සහිත සුවිශේෂී උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත්වීම.

# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය


මහාචාර්ය එච්.ජානක.ද.සිල්වා
අධ්‍යක්ෂක
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

මහාචාර්ය සේනක රාජපක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂක
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

එස්.අනූෂා
නියෝජ්‍ය ලේඛකාධිකාරී
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

ඇමතුම්
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
නො.160
මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත,
කොළඹ 07
(+94) 112 697758
(+94) 112 681052
(+94) 112 696261


<u>දැක්ම</u>

රටෙහි සහ කළාපයෙහි සෞඛ්‍ය අවශ්‍යතා ඉටු කිරීමත් ලෝක සෞඛ්‍ය ක්ෂේත්‍රය කෙරෙහි දායකවීමත් උදෙසා ඉහළ කාර්යශූරත්වයෙන් යුතු විශේෂඥවරුන් සහ අනෙකුත් වෘත්තීකයන් බිහිකිරීමෙහි සුවිශේෂීතාව සඳහා ජාත්‍යන්තරව පිළිගත් මධ්‍යස්ථානයක් බවට පත්වීම.

විශ්ව විද්‍යාලයීය මට්ටම සාධනය කරගැනීමේ අවසන් අරමුණින් යුතුව අධ්‍යයනය, මූල්‍යමය සහ පරිපාලනමය වශයෙන් ස්වාධීනව ක්‍රියාත්මක වන ආයතනයක් බවට පත්වීම.

<u>මෙහෙවර</u>

ශ්‍රී ලාංකීය ජනතාවට, කළාපයට සහ ලෝකයට ප්‍රශස්ත සහ මානුෂික සෞඛ්‍ය සත්කාරය සැලසීම වෙනුවෙන් ඉහළම ගුණාත්මකභාවය, ප්‍රවීණත්වය සහ කැපවීම සහිත විශේෂඥවරුන් සහ අනෙකුත් වෘත්තිකයන් බිහිකිරීම සඳහා අවශ්‍ය පශ්චාත් අධ්‍යයන වැඩසටහන් සැලසුම් කිරීම සහ සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.

අරමුණු සහ පරමාර්ථ

අරමුණු

- ඉගැන්වීම්- ඉගෙනුම්, පුහුණු සහ පර්යේෂණයන්හි අඛණ්ඩ ඉහළ ස්ථාවරයන් සාක්ෂාත්කර ගැනීම.
- ජාතික සෞඛ්‍ය සේවා අවශ්‍යතාවන් පිරිමැසිය හැකිවන පරිදි පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම.
- රටෙහි සෞඛ්‍ය සහ වෛද්‍ය අධ්‍යාපණික ප්‍රතිපත්තීන් විධිමත්ව සකස් කිරීමෙහි ලා දායක වීම.
- පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනයෙහි සහ පර්යේෂණයන්හි ලා ආයතනයේ ක්‍රියාකාරීත්වය වඩා ව්‍යාප්ත සහ පුළුල් බවට පත්කිරීම.
- ආයතනයෙහි ඉහළ යන අධ්‍යාපනික අවශ්‍යතාවන් සැපිරිය හැකිවන පරිදි සහ එහි තත්ත්වය තහවුරු වන පරිදි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

පරමාර්ථ

- දේශීය අවශ්‍යතාවය සැපිරිය හැකි පරිදි ඉහළ මට්ටමේ ගුණාත්මක භාවයකින් සමන්විත සෞඛ්‍ය සේවාවක් සඳහා ප්‍රමාණවත් මිනිස් සම්පතක් බිහි කිරීම.
- නිරන්තර ඉගෙනුම තුලින් සෞඛ්‍ය වෘත්තීකයින්ගේ කුසලතා සහ නිපුණතාවන් පවත්වාගෙන යාම සහ වැඩිදියුණු කිරීම.
- සෞඛ්‍ය වෘත්තීකයින්ගේ නිරන්තර අධ්‍යයනයන් සඳහා ඉඩ පහසුකම් සලසන ක්‍රමවේදයන් ඇතිකිරීම සහ නිර්මාණය.
- වෛද්‍ය වෘත්තීකයින් අතර වැඩදායී ආකල්ප සහ ස්වයං ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීම.
- පශ්චාත් උපාධි අධ්‍යයනයන්ට අදාලව පවත්නා සම්පත් සහ සුදුසු තාක්ෂණයන් භාවිතා කිරීම දිරිගැන්වීම.
- සෞඛ්‍ය ගැටළු විසඳීමේදී සෞඛ්‍ය සේවා කණ්ඩායම් භාවිතය පිළිබඳ සංකල්පය හඳුන්වාදීම.
- දුර්වලතා සහ වැඩිදියුණු කරගතයුතු දේ පිළිබඳව තොරතුරු සපයා ගැනීම සඳහා වෛද්‍ය අධ්‍යාපනික වැඩසටහන් ඇගයීමට ලක් කිරීම.
- නිවාරක සහ ප්‍රතිකාරක සත්කාරයන් මනාව සමෝධානය වී ඇති සේවාස්ථ වැඩසටහන් සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකාව තුළ පශ්චාත් උපාධි මට්ටමේ වෛද්‍ය අධ්‍යාපනය ඉහල මට්ටමකින් පවත්වාගැනීම සඳහා විදේශීය අධ්‍යයන ආයතන සමග අන්‍යෝන්‍ය ශුභසිද්ධිය සැලසෙන ආකාරයේ අධ්‍යාපනික සබඳතාවන් වැඩිදියුණු කරගැනීම. රටෙහි සෞඛ්‍ය සේවා අවශ්‍යතාවන් සැපිරීම මෙන්ම කලාපීය සහ ලෝක වෛද්‍ය ක්ෂේත්‍රයනට ක්‍රියාකාරී දායකත්වයක් සපයන්නාවූ ඉහළ මට්ටමේ වෘත්තීමය විශේෂඥයන් බිහිකරන මූල්‍යමය සහ පරිපාලනමය වශයෙන් ස්වාධීන මෙන්ම ජාත්‍යන්තරව පිළිගත් විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

## කළමනාකරණ මණ්ඩලය

කළමනාකරණ මණ්ඩලය ප්‍රධාන විධායක කමිටුව මෙන්ම පරිපාලන අධිකාරියද වෙයි.



## නිල බලයෙන් පත්වන සාමාජිකයෝ

මහාචාර්ය ජානක ද සිල්වා. අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය

මහාචාර්ය සේනක රාජපක්ෂ. නියෝජ්‍ය අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය

මහාචාර්ය ජයන්ත ජයවර්ධන. වත්මන් අධ්‍යක්ෂකවරයාට ආසන්නතම හිටපු අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය

වෛද්‍යාචාර්ය සුනිල් ජයන්ත නවරත්න. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

සුධර්මා කරුණාරත්න මහත්මිය. ලේකම්, සෞඛ්‍ය

ආර්.එම්.පී රත්නායක මයා. ලේකම්, මුදල්

වෛද්‍යාචාර්ය පී.ජී. මහීපාල. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

මහාචාර්ය ජෙනිෆර් පෙරේරා. වැඩබලන පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

මහාචාර්ය එම්.ඩී. ළමාවංශ. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය

මහාචාර්ය එස්. ලේකම්වසම්. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය එස්.බාලකුමාර්. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, යාපනය විශ්ව විද්‍යාලය

මහාචාර්ය මොහාන් ද සිල්වා. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

මහාචාර්ය එන්. ආර් ද සිල්වා. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය

මහාචාර්ය උපුල් බී. දිසානායක. පීඨාධිපති, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය කේ.ටී.සුන්දරේසන්. පීඨාධිපති, සෞඛ්‍ය උපස්ථායක විද්‍යා පීඨය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

මහාචාර්ය එස්.එච්. සිරිබද්දන. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා හා ආශ්‍රිත විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය ලක්ෂ්මී සෝමතුංග, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) - 1

වෛද්‍යාචාර්ය ජේ.එම්.ඩබ්ලියු. ජයසුන්දර බණ්ඩාර, නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (දන්ත වෛද්‍ය සේවා)

වෛද්‍යාචාර්ය සුනිල් ද අල්විස්, නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ )

අනෙකුත් සාමාජිකයින් **;**

මහාචාර්ය පී.ආර්. ප්‍රනාන්දු පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය/, කොළඹ විශ්ව විද්‍යාලය

මහාචාර්ය පී.වී.ආර්.කුමාරසිරි,පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය/, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

මහාචාර්ය අයි.එම්.ආර්.ගුණවර්ධන. පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය/, රුහුණු විශ්ව විද්‍යාලය

ආචාර්ය ටී.එස්.නවරත්නරාජා මිය. පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය/, යාපනය විශ්ව විද්‍යාලය

මහාචාර්ය දූලානි ගුණසේකර. පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය/, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය එස්.එස්.විලියම්ස්. පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය/, කැලණිය විශ්ව විද්‍යාලය

මහාචාර්ය එස්.එල්.ඒකනායක. පීඨ නියෝජිත, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය/,පේරාදෙණිය විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය ඒ.එන්.අරුල්ප්‍රගාසම්. පීඨ නියෝජිත,සෞඛ්‍ය උපස්ථායක විද්‍යා පීඨය/,නැගෙනහිර විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය එස්.පී.බී.තල්ගස්පිටිය. පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා සහ ආශ්‍රිත විද්‍යා පීඨය/, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය

මහාචාර්ය එස්.ඩී.ජයරත්න(සභාපති) / විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

මහාචාර්ය මල්කාන්ති චන්ද්‍රසේකර / විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

මහාචාර්ය අබ්දුල් හුසේන් / විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

මහාචාර්ය නන්දදේව සමරසේකර / විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

මහාචාර්ය රංජනී ගමගේ (මිය) / විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

ආචාර්ය හර්ෂ කබ්රාල්/ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

ආචාර්ය එස්.රවිරාජ්/ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

රාජන් ආශිර්වාදන් මයා/ සභාව විසින් නම් කරන ලද සාමාජික

සී.මාලියද්දේ මයා/ සභාව විසින් නම් කරන ලද සාමාජික

## ඓතිහාසික පසුබිම

ලංකා වෛද්‍ය විද්‍යාලය 1870 වර්ෂයේ දී ස්ථාපනය කිරීමත් සමඟ ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනය ආරම්භ විය. 1942 වසරේ දී කොළඹ විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීමෙන් අනතුරුව ලංකා වෛද්‍ය විද්‍යාලය වෛද්‍ය පීඨය බවට පත් විය. එම්.ඩී. සහ එම්.ඕ.ජී. උපාධි සඳහා විභාග පැවැත්වීම ආරම්භ වූ 1952 වසර තුළ සහ එම්.එස්. උපාධිය සඳහා විභාග පැවැත්වීම ආරම්භ වූ 1953 වසර වන තුරු ලංකා විශ්වවිද්‍යාලය මගින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි විභාග පවත්වනු නොලැබීය.

එකල ව්‍යුහාත්මක හෝ සංවිධිත පශ්චාත් උපාධි පුහුණු කිරීම් නොපැවැත්වුණි. එක්සත් රාජධානියේ පවත්වනු ලැබූ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි පුහුණු කිරීම් සඳහා වෛද්‍ය වෘත්තිකයන් සහභාගී වූ අතර විශේෂඥ වෛද්‍යවරුන් පත්කිරීම සඳහා එක්සත් රාජධානියේ විද්‍යායතන මගින් පිරිනමන ලද MRCP, FRCS, FFARCS, MRCOG, FRCR, MRCPath, MRCPsych සහ FDSRCS වැනි සුදුසුකම් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල මගින් පිළිගන්නා ලදී. මෙම විදේශ පුහුණුව වෙනුවට අධීක්ෂණය කරනු ලැබීමට යටත්ව තෙවසරක සේවාස්ථ පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව විභාගයක් පැවත්විය යුතු බව 1973 වසරේ දී, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටුවක් මගින් රජයට නිර්දේශ ඉදිරිපත් කරනු ලැබීය. ඒ අනුව, 1972 අංක 1 දරන ලංකා විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ 1976 වසරේ දී පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය (IPGM) ස්ථාපනය කර කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරනු ලැබීය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්, වෛද්‍ය හැල්ෆ්ඩන් මාහ්ලර් විසින් 1976 මාර්තු 2 වන දින පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය (IPGM) නිල වශයෙන් ආරම්භ කරනු ලැබීය. මහාචාර්ය කේ.එන්. සෙනෙවිරත්න මහතා එහි ප්‍රථම අධ්‍යක්ෂවරයා වශයෙන් පත් විය.

කෙසේ වුවද, එක්සත් රාජධානියේ විද්‍යායතන මගින් පවත්වනු ලැබූ විභාග කොළඹ දී පැවැත්වීම අඛණ්ඩව සිදුවීමත්, වෛද්‍ය වෘත්තිකයන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විභාගවලට පෙනී සිටීමට වඩා එක්සත් රාජධානියේ විභාගවලට පෙනී සිටීමට වඩාත් ප්‍රියමනාප භාවයක් දැක්වීමත් හේතුකොටගෙන අභිනවයෙන් පිහිටුවනු ලැබූ ආයතනයේ කටයුතු අඩාල විය. එබැවින්, මෙම ආයතනයේ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම අවශ්‍ය විය. එක්සත් රාජධානියේ විද්‍යායතන මගින් ශ්‍රී ලංකාව තුළ විදේශීය පශ්චාත් උපාධි විභාග පැවැත්වීම 1980 ජනවාරි 1 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි නවතාලීමටත්, මෙම ආයතනය මගින් ලබා දෙන පශ්චාත් උපාධි සඳහා පූර්ණ පිළිගැනීමක් ලබා දීමට සහ වැඩි සැලකිල්ලක් දැක්වීමටත් රජය තීරණය කරන ලදී.

ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් මෙම ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ 1979 වසරේ දී නැවත ස්ථාපනය කර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM) ලෙස නැවත නම් කරනු ලැබීය. වෛද්‍ය එස්.ඒ. කබ්රාල් මහතා එහි ප්‍රථම අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු ලැබීය. ඒ අනුව, ඉහත සඳහන් කරන ලද විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ සම්පාදනය කරන ලද 1980 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (PGIM) ආඥාපනත අංක 1 1980 අප්‍රේල් මස 10 වන දා සිට බලාත්මක විය. වෛද්‍ය විද්‍යාවේ විවිධ විශේෂඥතාවන් සඳහා අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කරනු ලැබූ අතර නිර්වින්දනවේදය, ප්‍රජා වෛද්‍ය විද්‍යාව, දන්ත ශල්‍යවේදය, පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය කර්මය, වෛද්‍ය විද්‍යාව, නාරිවේදය හා ප්‍රසවවේදය, අක්ෂිවේදය, ව්‍යාධිවේදය, ළමා චිකිත්සාව, මනෝ චිකිත්සාව, විකිරණවේදය සහ ශල්‍යවේදය වැනි විවිධ විශේෂඥතාවන් සඳහා පාඨමාලා හා විභාග සංවිධානය කරන ලදී. 1985 වසරේ දී තවත් අධ්‍යයන මණ්ඩල හතරක් එනම්, ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව, වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යාව, කර්ණනාසිකස්වරාලවේදය සහ සායනික අර්බුදවේදය ස්ථාපනය කරනු ලැබීය. මහාචාර්ය ආර්.ජී. පානබොක්කේ මහතා 1990 වසරේ දී මෙම ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් විය. වෛද්‍ය පරිපාලනය සහ චර්මවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩල 1994 දී ද, මෛථුනවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩල 2001 වසරේ ද ස්ථාපනය කරන ලදී. වෛද්‍ය ජේ.බී. පීරිස් මහතා 1995 වසරේ ද, මහාචාර්ය ලලිතා මෙන්ඩිස් මහත්මිය 2002 වසරේ ද, මහාචාර්ය රෙස්වි ෂෙරීෆ් මහතා 2006 වසරේ ද, මහාචාර්ය ජයන්ත ජයවර්ධන 2012 වසරේ ද, මහාචාර්ය එච්. ජානක ද සිල්වා මහතා 2014 වසරේ ද මෙම ආයතනයේ අධ්‍යක්ෂවරුන් ලෙස පත් වූහ. නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර 2011 වසරේ දී ස්ථාපනය කරන ලද අතර මහාචාර්ය ජයන්ත ජයවර්ධන, මහාචාර්ය ප්‍රශාන්ත විජේසිංහ, මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන සහ මහාචාර්ය සේනක රාජපක්ෂ මෙම ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර දැරූහ. 1980 ආඥාපනත සඳහා සිදු කරන ලද සංශෝධන 2014 ජූලි 1 වන දින සිට බලාත්මක වූ අතර සංශෝධිත ආඥාපනත යටතේ නව අධ්‍යයන මණ්ඩල කීපයක් සහ විවිධ විශේෂඥතාවන් සඳහා අධ්‍යයන මණ්ඩල කීපයක් ස්ථාපනය කරන ලදී.

## අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය



2014 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ අතිශයින්ම සතුටු වෙමි.

1980 වසරේ සිට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි පුහුණු කටයුතු වල නිරතව සිටින වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් එදා මෙදාතුර වෛද්‍ය විශේෂඥයින් 3000 කට අධික සංඛ්‍යාවක් පුහුණු කර තිබේ. අප දිවයිනේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, අපගේ වැඩසටහන් සඳහා ඇතුළත් කර ගනු ලබන වෛද්‍ය වෘත්තිකයන් සංඛ්‍යාව අඛණ්ඩව වැඩි කිරීමට ද, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට අදාළ වන ක්ෂේත්‍ර සඳහා නව උපාධි වැඩසටහන් හඳුන්වා දීමට ද අපි උත්සාහ දැරුවෙමු.

2014 වසරේ දී අප ආයතනයේ අධ්‍යයන නිපැයුම ලෙස සුදුසුකම් සම්පූර්ණ කරන ලද විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව ප්‍රශංසනීය මට්ටමක තිබුණි. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් පවත්වනු ලබන වැඩසටහන් 114 කින් පුහුණුව ලබන වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව 2661 ක් වේ. නව ඇතුළත් වීම් සංඛ්‍යාව 855 ක් වේ. 2014 වසරේ දී විභාග 100 කට අධික ප්‍රමාණයක් පවත්වනු ලැබූ අතර පුහුණුව ලැබූ වෛද්‍ය වෘත්තිකයන් 693 දෙනෙකු සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබීය. මෙම වසර තුළ, මෙම ආයතනයේ අධ්‍යයන මණ්ඩල මගින් වෛද්‍යවරුන් 207 දෙනෙකු විශේෂඥ වෛද්‍යවරුන් ලෙස සුදුසුකම් ලබා ඇති බව සහතික කරනු ලැබීය.

අප ආයතනයේ පරිපාලන කටයුතු තවදුරටත් සරලව, කාර්යක්ෂමව සහ මනා සංවිධිත තත්ත්වයකින් පවත්වා ගැනීම සඳහා පියවර ගෙන තිබේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥාපනත සඳහා සංශෝධන ජූලි මාසයේ දී ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීය. මැයි මාසයේ දී නව වෙබ් අඩවියක් ආරම්භ කරනු ලැබූ අතර මෙම ආයතනයේ පුහුණුව ලැබීමට අපේක්ෂා කරන වෛද්‍ය වෘත්තිකයන් සඳහා අවශ්‍ය වන තොරතුරු බොහොමයක් මෙම වෙබ් අඩවියට ඇතුළත් කර තිබේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාල සේවා ස්වයංක්‍රීයකරණය කිරීම නොවැම්බර් මාසයේ දී ආරම්භ කරන ලදී. පැරණි උපාධි ප්‍රකාශ පත්‍ර කීපයක් සංශෝධනය කිරීමේ ක්‍රියාවලයේ සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීමේ කටයුතු ද ආරම්භ කරන ලදී. නඩු මඟට පිවිසීමේ අවස්ථා අඩු කිරීමේ අරමුණින් පුහුණු වන්නන්ට ඔවුන්ගේ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා සමථ කමිටුවක් ද ස්ථාපනය කර තිබේ.

යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මහල් අටකින් සමන්විත වන නව ගොඩනැගිල්ල ඉදි කිරීම ජූනි මාසයේ දී ආරම්භ කරන ලද අතර දැනට පවතින ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා සැලසුම් සකස් කරමින් පවතී. මේ වන විට ද මිලට ගෙන ඇති කොළඹ 08 ප්‍රදේශයේ පිහිටි භූමිය භාවිත කරමින් සිදු කිරීමට නියමිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අතිවිශාල ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගැනීමට අපේක්ෂිතය.

කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්, අධ්‍යයන මණ්ඩල, විශේෂඥ අධ්‍යයන මණ්ඩල සහ විභාග මණ්ඩල සාමාජිකයන්, පුහුණු කරුවන් සහ විභාග පරීක්ෂකයන් මෙම ආයතනයේ උන්නතිය සඳහා ලබා දෙන දායකත්වය පිළිබඳව මගේ ස්තූතිය පිරි නැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි. මෙම ආයතනයේ විශිෂ්ටත්වය වන්නේ සියළුම පුහුණු කිරීම් ස්වේච්ඡා පදනමකින් සිදු වීම බව මම නැවත නැවතත් අවධාරණය කරමි. මෙම වසරේ පත් කරන ලද නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයාගේ කුසලතා පූර්ණ මඟ පෙන්වීම යටතේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන සහ ලිපිකාර කාර්ය මණ්ඩලය ඔවුන්ගේ රාජකාරී කටයුතු ප්‍රශංසනීය අන්දමින් ඉටු කර ඇත.

මහාචාර්ය එච්. ජානක ද සිල්වා

අධ්‍යක්ෂ/ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## 1. සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර

| පාඨමාලාව | පුහුණු ලාභීන් ප්‍රමාණය | සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|
| සේවාස්ථ පුහුණු | 97 | * |
| පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලා | 65' | * |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 570 | * |
| එම්.එස්.සී | 183 | * |
| එම්.ඩී. (පූර්ව එම්.ඩී/ පශ්චාත් එම්.ඩී.) | 1746 | * |
| එකතුව | **2661** | |

vii

iii

*ක්ෂේත්‍ර විශේෂඥයින්ගේ සේවය බාහිර කථිකාචාර්යවරුන් ලෙස ලබාගනු ලැබේ

## 2. දේශීය සිසුන් පිළිබඳ විස්තර

| පාඨමාලාව | 2014 කාණ්ඩය | පළමු වසර | දෙවන වසර | තෙවන වසර | උපාධිලාභීන් | සිවුවැනි වසර | පස්වන වසර | හයවැනි වසර |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | පශ්චාත් උපාධි පුහුණු | | |
| සේවාස්ථ | 31 | 56 | 21 | 20 | | | | |
| පශ්චාත් උපාධි සහතිකපත්‍ර | 29 | 65 | | | 96 | | | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 362 | 505 | 65 | | 228 | | | |
| එම්.එස්.සී | 69 | 150 | 33 | | 104 | | | |
| එම්.ඩී | 364 | 672 | 165 | 62 | 265 | 398 | 35 | 03 |
| එතෙර පුහුණු | | | | | | | 381 | 30 |
| එකතුව | **855** | **1448** | **284** | **82** | **693** | **398** | **416** | **33** |

**3.** විදේශීය සිසුන් පිළිබඳ විස්තර

| පාඨමාලාව | කාණ්ඩය | පළමු වසර | දෙවන වසර | තෙවන වසර | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| එම්.ඩී (ව්‍යවහාරික විද්‍යා) | - | - | - | 01 | 01 |
| එම්.ඩී (චර්මවේද) | - | - | - | 01 | 01 |
| එකතුව | **-** | **-** | **-** | **02** | **02** |

**4.** අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| පීඨය/ශාඛාව | විෂයය/විනය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය | උපදේශක |
|---|---|---|---|---|---|---|---|
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | අධ්‍යක්ෂ | 01 | | | | | |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | | 01 | | | | |
| වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය | රසායනාගාර සේවා | | | 01 | | | |
| වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය | සායනික සේවා | | | 01 | | | |
| වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය | වෛද්‍ය අධ්‍යාපනය | | | 01 | 01 | | |
| අධ්‍යයන | අර්ධ කාලීන පාඨමාලා අධ්‍යක්ෂක | 02 | | | | | |
| පුස්තකාල | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති | 02 | | | | | |
| | සහකාර පුස්තකාලාධිපති | 01 | | | | | |

**5.** අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| පීඨය/ශාඛාව | පරිපාලන | අධ්‍යයන සහාය | ලිපිකරු සහ සමාන්තර | සුළු සේවක |
|---|---|---|---|---|
| ආයතන සහ සාමාන්‍ය පරිපාලන | 02 | 01 | 13 | 11 |
| අධ්‍යයන සහ වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය | 03 | - | 15 | 03 |
| | | - | 03 | 02 |
| විභාග | 02 | 01 | 22 | 03 |
| ගිණුම් | 02 | - | 12 | 02 |
| පුස්තකාලය | - | - | 10 | 06 |

**6.** පර්යේෂණ නවෑකරණ සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| විෂයය | කාර්ය මණ්ඩලය | පුහුණු ලාභීන් |
|---|---|---|
| පර්යේෂණ සංඛ්‍යාව | - | - |
| උපාධි ප්‍රබන්ධ සංඛ්‍යාව | - | 23 |
| නිබන්ධන සංඛ්‍යාව | - | 109 |
| ලිපි සංඛ්‍යාව | 2 | - |
| එකතුව | **2** | **132** |

**7.** වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර

| විෂයය | සහභාගී වූ සංඛ්‍යාව | සම්පූර්ණ කළ සංඛ්‍යාව | ඉදිරිපත් කිරීම් සිදුකළ සංඛ්‍යාව (වැඩමුළු) |
|---|---|---|---|
| පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව | 30 | 40 | 25 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | 16 | 18 | |
| උපාධි වැඩසටහන් සංඛ්‍යාව | NR | NR | NR |
| ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | NR | NR | NR |
| සහතිකපත්‍ර වැඩසටහන් සංඛ්‍යාව | NR | NR | NR |
| වෙනත් | | | |
| පශ්චාත් උපාධි සහතිකපත්‍ර වැඩසටහන් | 01 | 05 | |
| එකතුව | 47 | 63 | 25 |

**8.** ලැබුණු සම්මාන පිළිබඳ තොරතුරු

සම්මාන ලැබී නැත

**9.** ඇරඹූ නව පාඨමාලාවන් පිළිබඳ තොරතුරු

නව පාඨමාලාවන් ඇරඹීමක් සිදු නොවිනි. යථා කාලයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පහත පුහුණු වැඩසටහන් සඳහා පූර්ව නිවේදනයන් සැකසීමට පියවර ගනු ලැබිනි.

- ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- වෘද්ධ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- සෞඛ්‍යයට අදාළ තොරතුරු පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- පෝෂණය පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- රක්ත-අර්බුදවේදය පිළිබඳව වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- වේදනා සමන උපස්ථානය පිළිබඳව පශ්චාත් උපාධිය

## 10. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂයය | 2013<br>රුපියල් | 2014<br>රුපියල් |
|---|---|---|
| පුද්ගල පඩිනඩි | 64,435,311 | 83,850,623 |
| ගමන් වියදම් | 7,617,735 | 8,632,373 |
| සැපයුම් | 8,209,462 | 7,403,596 |
| නඩත්තු වියදම් | 2,192,803 | 2,923,260 |
| ගිවිසුම්ගත සේවාවන් | 14,164,743 | 21,014,609 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 41,526,394 | 56,372,401 |
| පශ්චාත් උපාධි පුහුණු වියදම් | 34,424,005 | 15,700,120 |
| එකතුව | **172,570,453** | **195,896,982** |

## 11. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂයය | 2013<br>රුපියල් | 2014<br>රුපියල් |
|---|---|---|
| ගෘහභාණ්ඩ සහ උපකරණ අත්කර ගැනීම | 12,248,944 | 4,863,857 |
| විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ අත්කර ගැනීම | 691,630 | 204,000 |
| ගොඩනැගිලි අත්කරගැනීම සහ ව්‍යුහ දියුණු කිරීම | -- | 249,160,500 |
| ග්‍රන්ථ සහ සඟරා අත්කර ගැනීම | 14,299,638 | 13,687,150 |
| වෙනත් (වාහන) | 9,990,000 | |
| වත්කම් පුනරුත්ථාපනය සහ නඩත්තුව | 1,212,488 | 981,344 |
| එකතුව | **38,442,700** | **268,896,851** |

## 12. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක)

| ව්‍යාපෘතියේ නම සහ විස්තර | ණය/ ප්‍රධානය | අරමුදල් සම්පාදක | සමස්ත පිරිවැය ඇස්තමේන්තුව | අයදුම්පත සඳහා ඉල්ලීම | වට්ටම් සංගුණකය |
|---|---|---|---|---|---|
| ජෛව වෛද්‍ය විද්‍යාපන විද්‍යාව පිළිබඳ එම්.එස්.සී උපාධිය සඳහා විද්‍යාපති අධ්‍යයනය පිළිබඳ නොරාඩ් වැඩසටහන **(NOMA)** | ප්‍රධානය | ඔස්ලෝ විශ්ව විද්‍යාලය | 138,356,221 | * අදාළ නොවේ | * අදාළ නොවේ |
| දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය **(DEMP)** | ප්‍රධානය | | 7,568,536 | * අදාළ නොවේ | * අදාළ නොවේ |
| එකතුව | | | **145,924,757** | | |

* අදාළ නොවේ – වාර්ෂික ප්‍රදානය කල් ඇතිව ලබා දී ඇත

**13.** ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක)

| ව්‍යාපෘතියේ නම | සමස්ත පිරිවැය ඇස්තමේන්තුව | 2013 වසරේ වියදම රුපියල් | 2014 වසරේ වියදම රුපියල් | **31.12.2014** දිනට සමුච්චිත වියදම රුපියල් |
|---|---|---|---|---|
| ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳ එම්.එස්.සී උපාධිය සඳහා විද්‍යාපති අධ්‍යයනය පිළිබඳ නොරාඩ් වැඩසටහන **(NOMA)** | 138,356,221 | 14,061,579 | 18,888,945 | 131,938,996 |
| දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය **(DEMP)** | 7,568,536 | 1,250,134 | 12,215 | 7,158,096 |
| එකතුව | **145,924,757** | **15,311,713** | **18,901,160** | **139,097,092** |

**14.** මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)

| විෂයය | රජයේ ප්‍රදානයන් 2014 | උත්පාදිත ආදායම 2014 | වියදම 2014 | ඉතුරුම් අතිරික්තය |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් ව්‍යාපෘතිය | 50,000,000 | 166,651,219 | 195,896,982 | 20,754,237 |
| ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘතිය | 319,550,000 | - | 268,896,851 | 50,653,149 |
| දේශීය අරමුදල් මත ක්‍රියාත්මක ව්‍යාපෘති | - | - | - | - |
| විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක ව්‍යාපෘති | - | - | - | - |
| වත්කම් අපහරණය | - | (236,092) | - | - |
| එකතුව | **369,550,000** | **166,415,127** | **464,793,833** | **71,407,386** |

**15.** මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)

| ආදායම් මූලාශ්‍රය | 2014 ප්‍රතිපාදන රුපියල් | 2014 එකතු වූ මුදල රුපියල් | ඌණතාව/අතිරික්තය රුපියල් |
|---|---|---|---|
| ප්‍රථම උපාධි අධ්‍යයනය | - | - | - |
| පශ්චාත් උපාධි අධ්‍යයනය | 162,120,000 | 154,840,946 | (7,279,054) |
| විශේෂඥ උපදේශකත්වයන් | - | - | - |
| වෙනත් | 4, 380,000 | 11,810,273 | 7,430,273 |
| එකතුව | **166,500,000** | **166,651,219** | **151,219** |

**16.** මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2014

| විෂයය | සූත්‍රය | සිසුවකු සඳහා වූ වියදම |
|---|---|---|
| එක් සිසුවකු/සිසුවියක සඳහා වූ පුනරාවර්තන වියදම | පුනරාවර්තන වියදම - සිසුන්/සිසුවියන් සංඛ්‍යාව | 73,617.80 |
| එක් සිසුවකු/සිසුවියක සඳහා වූ ප්‍රාග්ධන වියදම | පුනරාවර්තන වියදම - සිසුන්/සිසුවියන් සංඛ්‍යාව | 101,051.05 |
| එකතුව | | **174,668.85** |

**17.** 2014 වසරේ ලැබුණු යටිතල පහසුකම් පිළිබඳ විස්තර

| යටිතල පහසුකම් විස්තර | වියදම රුපියල් | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ගොඩනැගිල්ලේ දකුණු කොටස වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 43,121,419.55 | 26% |
| වායු සමීකරණ සවිකිරීම | 1,703,252.63 | සම්පූර්ණ කර ඇත |
| වැසි ජලාපවහන පද්ධතිය අළුත්වැඩියා කිරීම | 204,926.40 | සම්පූර්ණ කර ඇත |
| ඇළුමිනියම් පාටිෂන් කටයුතු | 407498.90 | සම්පූර්ණ කර ඇත |
| තව් සහිත කෝණ ආවරණය | 473616.80 | සම්පූර්ණ කර ඇත |

**18.** වෙනත් තොරතුරු

**18.1** ආයතනික ක්‍රියාකාරකම්

**18.1.1.** ලියාපදිංචි කිරීම්

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2014 වසර තුළ අධ්‍යයන මණ්ඩල 22 ක සහ විශේෂඥ මණ්ඩල 18 ක සෘජු අධීක්ෂණය යටතේ එම්.ඩී, එම්.එස්.සී, පී.ජී ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර යන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි පාඨමාලාවන් 114 ක් පවත්වනු ලැබිනි. (වගුව 01)

එම්.ඩී, එම්.එස්.සී, පී.ජී ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර යන ක්ෂේත්‍රයන්හි උපාධි පාඨමාලාවන් සඳහා වූ පුහුණු වැඩසටහන් සඳහා නවක සිසුන් 855 ක් ඇතුලත් සමස්තයක් ලෙස 2661 ක් වූ පශ්චාත් උපාධි පුහුණුලාභීන් සංඛ්‍යාවක් බඳවා ගනු ලැබිනි.(වගුව 02) ඔවුන් අතරින් 2185 දෙනෙකු දේශීය වශයෙන් පුහුණුව ලබති.

### 18.1.2. අධ්‍යයන අවධාරණය

2014 වසරේ අධ්‍යයන අවධාරණය නාභිගත වූයේ නව පුහුණු වැඩසටහන් හඳුන්වාදීම මත හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විෂයමාලාවන් සමග ප්‍රමිතිකරණය කරමින් සහ නවතම ශිල්පක්‍රම අන්තර්ග්‍රහණය කරමින් පවතින පුහුණු වැඩසටහන්වල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා විෂයමාලා සහ උපාධි ප්‍රකාශපත්‍ර සංශෝධනය කිරීම මතය.

මෙම වසරේදීද එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව සහ මැලේසියාවේ විශිෂ්ට කේන්ද්‍රස්ථානයන්හි සිදුකරන එම්.ඩී. උපාධි පරීක්ෂණවල බාහිර විභාග පරීක්ෂකයන්ගේ වාර්තාවන්හි සඳහන් නිර්දේශ පදනම් කරගෙන පුහුණුකරුවන් සහ විභාග පිළිතුරුපත්‍ර පරීක්ෂකයන් නව ශිල්පක්‍රම වලින් සන්නද්ධ කිරීමට මෙන්ම විභාග ආකෘතිපත්‍ර වල තත්ත්වය ඉහළ නැංවීම සහ පුහුණු වැඩසටහන්වල සහ විභාගවල පිළිගතහැකි ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ඔවුනට උචිත මාතෘකා ඔස්සේ වැඩමුළු මාලාවක් පවත්වන ලදී

මෙම වර්ෂය තුළදී පවත්නා වැඩසටහන්වල පහත සඳහන් විෂය මාලා සහ උපාධි ප්‍රකාශපත්‍ර ප්‍රතිශෝධනය සිදු කරනු ලැබිනි.

- කර්ණනාසිකස්වරාලවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- අක්ෂිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- විකිරණවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- පුනර්ජීවන දන්තචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- මනෝචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- මෛථුනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- සායනික රක්තවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- දන්ත - හනු චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- ස්නායුවේදය පිළිබඳව වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- ළමාචිකිත්සා
- ළමාචිකිත්සා අන්තරාසර්ගවේදය පිළිබඳව වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- නවජ සහ පරිසූතික ඖෂධ පිළිබඳව වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- ප්‍රජා වෛද්‍යවිද්‍යාව/ප්‍රජා දන්තචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය
- නීති වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- රක්තවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

**18.1.3.** මෙහෙයුම් කමිටුවක් ස්ථාපනය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි උපදෙස් මත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි සංවර්ධනය සහ 100,000ක ජනගහනයක් සඳහා විශේෂඥ වෛද්‍යවරුන් 11 දෙනෙකු යෙදවීමේ ඉලක්කය ඇතිව දිවයින පුරා විශේෂඥ වෛද්‍ය සේවාවන් ඉහළ නැංවීම සඳහා මෙහෙයුම් කමිටුවක් ස්ථාපනය කරන ලදී.

**18.1.4.** පශ්චාත් උපාධි පුහුණුලාභීන් සඳහා සාමාන්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශ

2013 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද පශ්චාත් උපාධි පුහුණුලාභීන් සඳහා සාමාන්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශ පිළිබඳව වූ ලේඛණය 2015 වසරේ ජනවාරි මස සිට ක්‍රියාත්මක කළ හැකිවන පරිදි 2014 වසර තුළදී කළමනාකරණ මණ්ඩලය/සෙනේට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ අන්තර්ගත කරගනිමින් සංශෝධනය කරනු ලැබිනි.

වගු අංක 01- වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යයන වැඩසටහන්

| අධ්‍යයන මණ්ඩල | සහතිකපත්‍ර/ඩිප්ලෝමාවන් |
|---|---|
| | විද්‍යාපති/උපාධි/ උප විශේෂ්‍යයන් |
| නිර්වින්දනවේදය | නිර්වින්දනවේදය පිළිබඳව නිපුණතා සහතිකය |
| | උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | උප විශේෂ්‍යයන් |
| | පහත ක්ෂේත්‍රයන්හි විශේෂ පුහුණුව සහිත නිර්වින්දනවේදය |
| | හෘත් - උරස්ථ නිර්වින්දනවේදය |
| | ස්නායුවේද නිර්වින්දනවේදය |
| | ප්‍රසවවේද නිර්වින්දනවේදය |
| | ළමා චිකිත්සක නිර්වින්දනවේදය |
| | දැඩි සත්කාර නිර්වින්දනවේදය |
| | වේදනා කළමනාකරණ නිර්වින්දනවේදය |
| මූලික වෛද්‍ය විද්‍යාවන් | කායව්‍යවච්ඡේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | භෞතවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව සහ ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව | ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය |
| | ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය |
| | ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| සායනික අර්බුදවේදය | සායනික අර්බුදවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | රක්තවේද අර්බුදවේදය |
| දන්ත ශල්‍යවේදය | රෝහල් දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | රෝහල් දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (දුරස්ථ අධ්‍යාපන) |
| | මුඛ හා හනුවක්ත්‍ර ශල්‍ය චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | විකලාංග දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | පුනර්ජීවන දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | මුඛ ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| චර්මවේදය | චර්මවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| පවුල් වෛද්‍ය විද්‍යාව | පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (දුරස්ථ අධ්‍යාපනය) |
| | පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය (උපාධි නිබන්ධනය මගින්) |
| | පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය (විභාගය මගින්) |
| වෝහාරික වෛද්‍ය විද්‍යාව | නීති වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |

| | |
|---|---|
| වෛද්‍ය විද්‍යාව | ක්ෂය රෝගය සහ ළය රෝග පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | උප විශේෂයයන් |
| | හෘත්වේදය |
| | හෘත්විද්‍යුත භෞතවේදය |
| | අන්තෝසර්ගවේදය |
| | ආමාශයික අන්ත්‍රවේදය |
| | වෘක්කවේදය |
| | ස්නායුවේදය |
| | ස්නායු භෞතවේදය |
| | ස්වසන වෛද්‍ය විද්‍යාව |
| | වාතරක්තවේදය සහ පුනරුත්ථාපනය |
| වෛද්‍ය පරිපාලනය | වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.එස්.සී උපාධිය |
| | වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.ඩී උපාධිය |
| වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව | වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | සායනික වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | පරපෝෂවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | වෛරසවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | දිලීරවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| බහුවිෂයක්ෂේත්‍රීය අධ්‍යයන පාඨමාලා | වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍රය |
| | අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | සෞඛ්‍ය ආංශික ආපදා කළමණාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය |
| | වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී උපාධිය |
| | අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය |
| | හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | උප විශේෂය |
| | සායනික ඖෂධ විද්‍යාව සහ චිකිත්සාව |
| නාරිවේදය හා ප්‍රසවවේදය | ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | නාරිවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | උප විශේෂයයන් |
| | නාරිවේද අර්බුදවේදය |
| | ඌණ - දරුඵල චිකිත්සාව |
| අක්ෂිවේදය | අක්ෂිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | උප විශේෂයයන් |
| | දෘෂ්ටිපටල ශල්‍යවේදය |

| | |
|---|---|
| | ළමාචිකිත්සා අක්ෂිවේදය |
| | ඇසේ සුද මතුවීම සහ බාහිර අක්ෂි රෝග |
| | ඇසේ කක්ෂිය සහ ඇස වටා කෙරෙන ප්ලාස්ටික් සැත්කම් |
| කර්ණනාසිකස්වරාලවේදය | කර්ණනාසිකස්වරාලවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| ළමාචිකිත්සාව | ළමා සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | ළමාචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | උප විශේෂ්‍යයන් |
| | ළමාචිකිත්සා නව්‍යසූතිවේදය |
| | ළමාචිකිත්සා හෘත්වේදය |
| | ළමාචිකිත්සා වෘක්කවේදය |
| | ළමාචිකිත්සා ස්නායුවේදය |
| | ළමාචිකිත්සා දෘඩිසත්කාර |
| | ළමාචිකිත්සා අන්තරාසර්ගවේදය |
| | ළමාචිකිත්සා ස්වසනවේදය |
| | ප්‍රජා ළමා චිකිත්සාව |
| ව්‍යාධිවේදය | මූලික පරීක්ෂණාගාර විද්‍යා පිළිබඳව සහතික පත්‍රය |
| | පටක ව්‍යාධිවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | රසායනික ව්‍යාධිවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | රක්තවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | පටක ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | රක්තවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| මනෝචිකිත්සාව | මනෝචිකිත්සාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | මනෝචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | උප විශේෂ්‍යයන් |
| | ව්‍යවහාරික මනෝචිකිත්සාව |
| | ළමා හා නවයෞවන මනෝචිකිත්සාව |
| විකිරණවේදය | විකිරණවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | උප විශේෂ්‍යයන් |
| | මැදිහත්වීම් විකිරණවේදය |
| | ළමාචිකිත්සක විකිරණවේදය |
| ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව | ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| ශල්‍යවේදය | ශල්‍යවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | විකලාංගවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | පහත ක්ෂේත්‍රයන් අවධාරණය කෙරෙන සාමාන්‍ය ශල්‍යවේදය |
| | පයර ආන්ත්‍රික ශල්‍යවේදය |
| | යාකෘත්ප්‍රදාහ අග්න්‍යාශයික පිත්ත ශල්‍යවේදය |
| | පහළ පයර ආන්ත්‍රික ශල්‍යවේදය |
| | වාහිණී ශල්‍යවේදය |
| | පියයුරු ශල්‍යවේදය |
| | අන්තෝසර්ග ශල්‍යවේදය |

| | |
|---|---|
| | ක්ෂති ශල්‍යවේදය |
| | උප විශේෂයයන් |
| | ශල්‍ය අර්බුදවේදය |
| | හෘත් - උරස්ථ ශල්‍යවේදය |
| | ආමාශයික අන්ත්‍ර ශල්‍යවේදය |
| | ළමා චිකිත්සක ශල්‍යවේදය |
| | ප්ලාස්ටික් ශල්‍යවේදය |
| | මෛත්‍රලිංගික ශල්‍යවේදය |
| | මෛත්‍රවේදික ශල්‍යවේදය |
| | වාහිණී ශල්‍යවේදය |
| | බද්ධකිරීමේ ශල්‍යවේදය |
| | ස්නායු ශල්‍යවේදය |
| | උරස්ථ ශල්‍යවේදය |
| මෛථුනවේදය | මෛථුනවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | මෛථුනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |

වගුව 02 - නවක ඇතුළත්වීම් **2014**

| වැඩසටහන | නවක ඇතුළත්වීම **2014** | ඩිප්ලෝමා/ සහතිකපත්‍ර | පශ්චාත් උපාධිය | එම්.එස්.සී උපාධිය | එම්.ඩී උපාධි පූර්ව | පශ්චාත් උපාධි (දේශීය) | විදේශීය | | සමස්තය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | දෙවන වර්ෂය | තෙවන වර්ෂය | |
| | | | **1** | **2** | **3** | **4** | **5** | | **1+2+3+4+5** |
| මූලික පරීක්ෂණාගාර විද්‍යා පිළිබඳව සහතිකපත්‍රය | 29 | 57 | | | | | | | 57 |
| වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව සහතිකපත්‍රය | | 8 | | | | | | | 8 |
| රසායනික ව්‍යාධිවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 5 | | | 9 | | | | | 9 |
| රක්තවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 11 | | | 35 | | | | | 35 |
| පටක ව්‍යාධිවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 11 | | | 30 | | | | | 30 |
| කායව්‍යවච්ඡේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | | | 10 | | | | | 10 |
| ළමා සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 116 | | | 116 | | | | | 116 |
| උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 21 | | | 42 | | | | | 42 |
| වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 16 | | | 32 | | | | | 32 |
| පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 44 | | | 44 | | | | | 44 |
| සෞඛ්‍ය අංශ ආපදා කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 14 | | | 29 | | | | | 29 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| රෝහල් දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 20 | | | 20 | | | | | 20 |
| නීති වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | | | 21 | | | | | 21 |
| වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 15 | | | 24 | | | | | 24 |
| අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | | | 16 | | | | | 16 |
| භෞතවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 8 | | | 8 | | | | | 8 |
| මනෝචිකිත්සාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 13 | | | 13 | | | | | 13 |
| ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 16 | | | 16 | | | | | 16 |
| ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | | | 11 | | | | | 11 |
| පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 5 | | | 14 | | | | | 14 |
| ක්ෂය රෝගය සහ ළය රෝග පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 38 | | | 59 | | | | | 59 |
| මෛථුනවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 9 | | | 21 | | | | | 21 |
| ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය | 6 | | | | 18 | | | | 18 |
| ප්‍රජා දන්ත චිකිත්සාව පිළිබඳව එම්.එස්.සී උපාධිය | 8 | | | | 13 | | | | 13 |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය | 35 | | | | 70 | | | | 70 |
| මානව පෝෂණය පිළිබඳව එම්.එස්.සී උපාධිය | | | | | 21 | | | | 21 |
| වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.එස්.සී උපාධිය | 20 | | | | 40 | | | | 40 |
| වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී උපාධිය | | | | | 21 | | | | 21 |
| සේවාස්ථ සායනික අර්බුදවේදය | 9 | 10 | | | | | | | 10 |
| සේවාස්ථ අක්ෂිවේදය | | 41 | | | | | | | 41 |
| සේවාස්ථ විකිරණවේදය | 22 | 46 | | | | | | | 46 |
| රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 2 | | | | 4 | 1 | 6 | 1 | 12 |
| රක්තවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 9 | | | | 23 | 5 | 9 | 2 | 39 |
| පටකව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 10 | | | | 14 | 11 | 10 | 2 | 37 |
| නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 34 | | | | 82 | 21 | 31 | 1 | 135 |
| සායනික අර්බුදවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 2 | | | | 11 | 6 | 9 | 1 | 27 |
| ප්‍රජා දන්තචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය | 4 | | | | 6 | 0 | | | 6 |
| ප්‍රජා වෛද්‍යවිද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | 15 | | | | 52 | 0 | 11 | | 63 |
| චර්මවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 8 | | | | 18 | 12 | 3 | | 33 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | 14 | | | | 31 | 0 | | | 31 |
| පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | | | | | 10 | 1 | 3 | | 14 |
| ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | 6 | | | | 15 | 1 | 6 | | 22 |
| වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.ඩී උපාධිය | 17 | | | | 30 | 2 | 1 | | 33 |
| අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | 8 | | | | 28 | 15 | 5 | | 48 |
| වෛද්‍ය පරපෝෂවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | | | | | 1 | | | | 1 |
| වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | 79 | | | | 131 | 145 | 101 | 5 | 382 |
| නාරිවේදය සහ ප්‍රසවවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 24 | | | | 48 | 10 | 19 | | 77 |
| මුඛ හා හනුවක්ත්‍ර ශල්‍ය චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය | 6 | | | | 15 | 3 | | | 18 |
| අක්ෂිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 19 | | | | 40 | 4 | 6 | | 50 |
| මුඛ ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | | | | | 1 | 0 | 1 | | 2 |
| මුඛ ශල්‍යවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | | | | | | | 2 | | 2 |
| දන්ත හනු චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය | 5 | | | | 9 | 0 | 2 | | 11 |
| විකලාංග ශල්‍යවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | | | | | 16 | 18 | | | 34 |
| කර්ණනාසික ස්වරාලවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 8 | | | | 9 | 4 | 8 | | 21 |
| ළමාචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය | 23 | | | | 78 | 41 | 41 | 6 | 166 |
| මනෝචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය | 10 | | | | 52 | 28 | 18 | 1 | 99 |
| විකිරණවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 12 | | | | 30 | 27 | 21 | | 78 |
| පුනර්ජීවන දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය | 1 | | | | 13 | 0 | 1 | | 14 |
| ශල්‍යවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 36 | | | | 107 | 61 | 55 | 6 | 229 |
| පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | 7 | | | | 8 | 5 | 4 | | 17 |
| මෛථුනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 3 | | | | 15 | 12 | 5 | 5 | 37 |
| වෛරසවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 2 | | | | 2 | 3 | 3 | | 8 |
| එකතුව | **855** | **162** | **570** | **183** | **899** | **436** | **381** | **30** | **2661** |

**18.1.(අ)** වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය **(MERC)**

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මෙහෙයවන ලද වැඩසටහන් රැසක මූලිකත්වය දැරීමේ අවස්ථාව වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය වෙත හිමිවූ 2014 වසර **MERC** සඳහා තවත් සුවිශේෂී වසරක් විය.

වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් එහි ආරම්භයේ සිටම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන පුවත් සංදේශය සැලසුම් කොට පළකිරීම සිදු කරන ලද අතර 2014 වසරේ මාර්තු මස එහි 26 වැනි වෙළුම ප්‍රකාශයට පත්කරන ලදී.

අභිනවයෙන් දියත් කරන ලද සහ වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරනු ලබන පාඨමාලාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම මගින් මෙම වර්ෂය වඩාත් හරවත් කරනු ලැබූ අතර බහුවිෂය ක්ෂේත්‍ර අධ්‍යයන පාඨමාලා පිළිබඳව අධ්‍යයන මණ්ඩලයේ සහ මූලික හා වෛද්‍ය විද්‍යා පිළිබඳ අධ්‍යයන මණ්ඩලයෙ සියළු විශේෂඥතා මණ්ඩල ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධීකරණයද වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සිදුකරන ලදී.

**18.1.(අ).1** වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරනු ලබන පාඨමාලාවන්

- භෞතවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- කායව්‍යවච්ඡේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍රය
- වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී උපාධිය
- සෞඛ්‍ය අංශ ආපදා කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය
- අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය
- අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය
- වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී උපාධිය
- වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- ජෛවවෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය
- සායනික ඖෂධ විද්‍යාව සහ චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය

**18. .(අ).2** වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය මගින් පුහුණුලාභීන් උදෙසා පවත්වනු ලැබූ වැඩමුළු

පර්යේෂණ ක්‍රමවේදයන් පිළිබඳව වූ පහත සඳහන් වැඩමුළු 2014 වසර තුළදී දෙවතාවක් පවත්වනු ලැබිනි

- නිරීක්ෂණ අධ්‍යයන සැලසුම් නිර්මාණය
- ව්‍යවහාර වෛද්‍ය විද්‍යා සංඛ්‍යාලේඛණ I
- දත්ත රැස්කිරීමේ ක්‍රමවේදයන් සහ නිශ්චයාත්මක ඇගයුම් කුසලතා
- ව්‍යවහාර වෛද්‍ය විද්‍යා සංඛ්‍යාලේඛණ II
- සසම්භාවිකෘත පාලිත සළකුණු නිර්මාණය සහ අර්ථ නිරූපනය
- ගුණාත්මක පර්යේෂණයන් සහ පර්යේෂණ ආචාරධර්ම
- දත්ත විශ්ලේෂණය - ප්‍රායෝගික අත්දැකීම්

- පර්යේෂණ යෝජනාවක් සැකසීම
| වෛද්‍ය එල්.එච්.එස්. ද සිල්වා මහත්මිය | තාවකාලික පදනම මත පත් කරන ලද ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ අර්ධකාලීන පාඨමාලා අධ්‍යක්ෂ | 2014.06.09 |
| වෛද්‍ය එල්.එච්.එස්. ද සිල්වා මහත්මිය | තාවකාලික පදනම මත පත් කරන ලද වෛද්‍ය පරිපාලනය පිළිබඳ අර්ධකාලීන පාඨමාලා අධ්‍යක්ෂ | 2014.06.09 |
| වෛද්‍ය ගීතානි වික්‍රමසිංහ මහත්මිය | තාවකාලික පදනම මත පත් කරන ලද පර්යේෂණාගාර විද්‍යා පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II වන ශ්‍රේණිය | 2014.06.01 |
| කේ.ඒ.එස්. ප්‍රියන්ත මහතා | කම්කරු III වන ශ්‍රේණිය (පැවරුම් පදනම) | 2014.01.13 |
| ආර්.ඒ.සී. රණසිංහ මහතා | කම්කරු III වන ශ්‍රේණිය (පැවරුම් පදනම) | 2014.01.13 |
| ඩී.එම්.යූ.බී. දිසානායක මහතා | කම්කරු III වන ශ්‍රේණිය (පැවරුම් පදනම) | 2014.01.13 |
| ඩබ්ලිව්.එම්.ඒ.කේ. විජේසේකර මහතා | කම්කරු III වන ශ්‍රේණිය (පැවරුම් පදනම) | 2014.01.13 |
| එච්.ඩී.ඒ.පී.කේ. සමරසිංහ මහතා | කම්කරු III වන ශ්‍රේණිය (පැවරුම් පදනම) | 2014.01.13 |
| ඊ.ඒ. නිශාන්ත එදිරිවීර මහතා | කම්කරු III වන ශ්‍රේණිය (පැවරුම් පදනම) | 2014.01.13 |

- ස්ථානමාරු

| නම | තනතුර | ස්ථාන මාරු වූ ආයතනය | දිනය |
|---|---|---|---|
| ඩබ්ලිව්.ඒ.එල්. වික්‍රමසිංහ මිය | නියෝජ්‍ය මූල්‍යාධිකාරි | රුහුණු විශ්වවිද්‍යාලයේ සිට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත | 2014.06.09 |

- සේවය දීර්ඝ කිරීම්

| නම | තනතුර | දිනය |
|---|---|---|
| පී.සී.පී. ප්‍රනාන්දු මෙය | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි | 08.11.2014 – 07.11.2015 |
| ඊපීඅයි ප්‍රේමරත්න මෙය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 23.10.2014 – 22.10.2015 |
| එම්.ජේ. නානායක්කාර මහතා | රියදුරු (අධි ශ්‍රේණිය) | 18.08.2013 – 17.08.2014 |
| ජයතිස්ස මහතා | පුස්තකාල සහායක (විශේෂ ශ්‍රේණිය) | 23.07.2014 – 22.07.2015 |
| කේ.බී. අල්විස් මිය | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (ලිපිකාර සේවා) | 09.02.2014 – 08.02.2015 |
| ආර්.ආර්.පී. අමරසේන මිය | මාණ්ඩලික සහකාර (ලිපිකාර සේවා) | 25.09.2014 – 24.09.2015 |
| ආර්.ඒ. චන්ද්‍රසේන මහතා | වැඩ පරිපාලක - III වන ශ්‍රේණිය | 05.10.2014 – 04.10.2015 |

- විදේශ නිවාඩු

| නම | තනතුර | රට | නිවාඩු ලබා ගන්නා කාලසීමාව |
|---|---|---|---|
| මහාචාර්ය සේනක රාජපක්ෂ | නියෝජ්‍ය අධ්‍යක්ෂ | එක්සත් රාජධානිය | 2014.10.13 - 014.11.14 |

- විදේශ අධ්‍යයන නිවාඩු

| නම | තනතුර | අධ්‍යයන නිවාඩු ලබා ගන්නා කාලසීමාව |
|---|---|---|
| වෛද්‍ය පී.ඒ. සිරිබද්දන මහතා | වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ ආධුනික කථිකාචාර්ය | 2012.08.15 - 2013 08.14<br>2013.08.15 - 2014.08.14<br>2014.08.15 - 2015.12.31 |
| වෛද්‍ය ඩබ්ලිව්.එම්.ඒ.යූ. ජයතිලක මහතා | වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය | 2013.06.09 - 2015.06.22 |

18.4.2. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥාපනත සංශෝධනය කිරීම

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව සහ කවුන්සලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමතිය සහිතව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥාපනත සඳහා සිදු කරන ලද සංශෝධන 2014 ජූලි මාසයේ දී ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

18.4.3. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ උතුරු දිශාවට දික්ව පිහිටි ගොඩනැගිලි කොටස (මර්ක් ගොඩනැගිල්ල)

මයික්‍රෝ කන්ස්ට්‍රක්ෂනස් (පුද්) සමාගම මගින් ප්‍රධාන පරිශ්‍රය තුළ මහල් අටකින් සමන්විත ගොඩනැගිල්ල ඉදි කිරීම 2014 නොවැම්බර් මාසයේ දී ආරම්භ කරනු ලැබූ අතර 2016 ජනවාරි මාසයේ දී සම්පූර්ණ කිරීමට නියමිතය.

18.4.4. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සංවර්ධන සැලැස්ම

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන සහ පරිපාලන ක්‍රියාකාරකම් පුළුල් කිරීම සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කරන ලද සංවර්ධන සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් 2013 අයවැය ඉදිරිපත් කිරීමේ දී රු. මිලියන 2500 ක් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙනුවෙන් වෙන් කරනු ලැබීය. ඒ අනුව, මෙම අධ්‍යයන ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා 2014 ජූනි මාසයේ දී රු. මිලියන 239 ක් වැය කරමින් බොරැල්ලේ රොඩ්නි වීදියේ පිහිටි පර්චස් 120 ක ඉඩමක් මිල දී ගන්නා ලදී.

18.4.5. සමාලෝචන මණ්ඩලයක් ස්ථාපනය කිරීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ එම පනතේ සංශෝධන යටතේ නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූලව පශ්චාත් උපාධි අපේක්ෂකයන් නඩු මඟට අවතීර්ණ වීම වැළැක්වීමේ අරමුණින් සමාලෝචන මණ්ඩලයක් ස්ථාපනය කිරීම සඳහා මුල් පියවර ගෙන තිබේ.

18.5 මූල්‍ය තොරතුරු

18.5.1. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

- ගිණුම්කරණ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නියම කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුගමනය කරනු ලබන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව, වත්කම් අත්පත් කර ගනු ලැබූ, බැරකම් ඇති වූ සහ අරමුදල් ලබා ගත් දිනවල පැවති වටිනාකමට අනුව ගනුදෙනු වාර්තා කරනු ලබන ගිණුම්කරණය පිළිබඳ ඓතිහාසික පදනම මත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර තිබේ.

- විදේශ මුදල් පරිවර්තනය

විදේශ මුදලින් සිදු කළ සියළුම ගනුදෙනු එවැනි ගනුදෙනු සිදු කරන ලද දිනයන්වල පැවති විනිමය අනුපාතිකවලින්ම ගිණුම්ගත කෙරේ. එවැනිගනුදෙනු පියවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන ලාභ සහ අලාභ සහ විදේශ මුදලින් දක්වනු ලබන මූල්‍යමය වත්කම් හෝ බැරකම් ගනුදෙනුවලින් ඇති වන ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශයේ දක්වනු ලැබේ. විදේශ මුදලින් දක්වනු ලබන මූල්‍යමය වත්කම් හෝ බැරකම් පරිවර්තනය කරනු ලබන්නේ ශේෂපත්‍ර දිනයේ පැවති විනිමය අනුපාතිකයන් අනුවය.

- ආදායම් දැක්වීම

(i) රජයේ ප්‍රදාන (පුනරාවර්තන)

පුනරාවර්තන වියදමට අදාළ සියලුම රජයේ ප්‍රදානයන් තථ්‍ය අරමුදල් ලැබීම් දිනයේ දී හඳුනා ගනු ලැබේ.

(ii) රජයේ ප්‍රදාන (ප්‍රාග්ධන)

දේපළ පිරියත සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා සම්බන්ධ ප්‍රදාන, විලම්භිත ආදායම ලෙෂ ජංගම නොවන වත්කම්වල ඇතුළත් කරනු ලබන අතර එම ප්‍රදාන අදාළ වත්කම්වල අපේක්ෂිත ආයුකාලය මුළුල්ලේ සරල රේඛීය පදනමකින් ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

රොඩ්නි වීදියේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම සඳහා ලැබුණු රජයේ ප්‍රදාන වැය නොවූ ප්‍රතිපාදන ලෙස දක්වයි.

(iii) පාඨමාලා ගාස්තු

පාඨමාලා ගාස්තු ඉගැන්වීමේ කාල පරිච්ඡේදය මුළුල්ලේ හඳුනා ගනු ලැබේ. එබඳු ප්‍රතිපාදන විවිධ මූල්‍ය කාල පරිච්ඡේදවලට යෙදවීමට ප්‍රමාණවත් තොරතුරු නොමැති වන අවස්ථාවල දී, එම ගාස්තු මූල්‍ය පදනමින් ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ. කෙසේ වුවද, 2014 වර්ෂයේ දී ලැබී තිබූ ගාස්තු සැලකිල්ලට ගෙන තිබුණි.

(iv) ආයෝජන ආදායම

ආයෝජන ආදායම උපචිත පදනමින් හඳුනා ගනු ලැබේ.

- භාණ්ඩ ලේඛන

    (i) ලිපිද්‍රව්‍ය

    ලිපිද්‍රව්‍ය තොග සහ අනෙකුත් විවිධ භාණ්ඩ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු අගයට තක්සේරු කරනු ලැබේ. සාමාන්‍යයෙන් පිරිවැය ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කළ ;ෂඣඪ* පදනමින් නිශ්චය කරනු ලැබේ.

- වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

    ➢ දේපළ, පිරියත සහ උපකරණ ; (PPE)

    දේපළ, පිරියත සහ උපකරණ ඒවා මත සිදු කළයුතු අමතර සහ සුළු වියදම් සමග මිලට ගැනීමේ පිරිවැයට සටහන් කරනු ලැබේ.පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කොට වත්කම් සඳහන් කරනු ලැබේ. ප්‍රදානයන් වශයෙන් ලැබුණු වත්කම් ඒවායේ සාධාරණ වටිනාකමට තක්සේරු කර ඇත.

    ➢ හානිකරණය

    වත්කමක ධාරණ අගය එහි අය කර ගත හැකි වටිනාකමට වහාම ලියා හරිනු ලබන අතර එවැනි අඩු කිරීමක් වියදමක් ලෙස වහාම හඳුනා ගනු ලැබේ.

    ➢ අපහරණය මත ලාභ හෝ අලාභ

    ලබන මුදල සමග ධාරණ අගය සංසන්දනය කිරීමෙන් අපහරණ මත ලාභ හෝ අලාභ නිර්ණය කරනු ලැබේ. මේවා ආදායම් ප්‍රකාශය තුළ ඇතුළත් කරනු ලැබේ.

    ➢ ක්ෂය කිරීම්

    මිල දී ගත් දිනය දන්නා වත්කම් සම්බන්ධයෙන් ක්ෂයකිරීම් සිදු කරනු ලබන්නේ සම්පූර්ණ කරන ලද මාස ගණනට සමානුපාතිකව හෝ මිල දී ගත් දිනයේ සිට එවැනි වත්කම් භාවිත කරන ලද ආකාරයට සමානුපාතිකවය. මිල දී ගනු ලැබූ නියම දිනය නොදන්නා වත්කම් සඳහා එම වත්කම් මිල දී ගන්නා ලද සම්පූර්ණ වර්ෂයම සඳහා ක්ෂය වෙන් කරනු ලැබේ. විකුණන/බැහැර කරන වර්ෂයේ දී වත්කම්වල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ආයු කාලයට සාපේක්ෂව භාවිත කරන ලද මාස ගණනේ අනුපාතය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

    පහත දක්වා ඇති තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ආයු කාලය මුළුල්ලේ ලියා හැරිය හැකි වන පරිදි සියළු දේපළ, පිරියත සහ උපකරණ සඳහා සරල රේඛීය පදනමින් ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ.

ක්ෂය අනුපාතික

- ගොඩනැගිලි - වර්ෂයකට 5%
- ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ - වර්ෂයකට 10%
- පරීක්ෂණාගාර සහ ඉගැන්වීමේ උපකරණ - වර්ෂයකට 20%
- පුස්තකාල ග්‍රන්ථ සහ වාර සඟරා - වර්ෂයකට 20%
- මෝටර් රථ - වර්ෂයකට 20%
- ඔරලෝසු - වර්ෂයකට 20%

- ලැබිය යුතු මුදල්

  ලබා ගත හැකි බවට තක්සේරු කරන ලද මුදල් පරිමාණවලින් ලැබිය යුතු මුදල් සඳහන් කරනු ලැබේ.

- ලැබිය යුතු පොළිය

  ලැබිය යුතු පොළිය භාණ්ඩ පත්‍ර දිනයේ දී අදාළ බැංකු මගින් තහවුරු කරන ලද අනුපාතිකයන්ට අනුකූලව ගණනය කරනු ලැබේ.

- මුදල් සහ මුදල් හා සමාන දේ

  මුදල් සහ බැංකු ශේෂයන් මෙන්ම කෙටි කාලීන ආයෝජනවලින් මුදල් සහ මුදල් හා සමාන දේ සමන්විත වේ.

- මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

  මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ පිළියෙළ කිරීමේ 'වක්‍ර ක්‍රමය' භාවිත කරමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ පිළියෙළ කර තිබේ. මුදල් සහ බැංකු ශේෂයන් මෙන්ම කෙටි කාලීන ආයෝජනවලින් බැංකු අයිරා අඩු කිරීම මගින් මුදල් සහ මුදල් හා සමාන දේ දක්වනු ලැබේ.

- සේවක ප්‍රතිලාභ

  - නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

    1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ අදාළ වන අනුපාතිකයන්ගෙන් විශ්‍රාම පාරිතෝෂික සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසනු ලබයි. මෙම පනත යටතේ පාරිතෝෂික ගෙවීම සඳහා සුදුසුකම් ලැබීම සඳහා සේවකයන් විසින් අවම වශයෙන් වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු වුවද, සියලුම සේවකයන් අවම වශයෙන් වසර පහක්වත් අඛණ්ඩව සේවය කරනු ඇතැයි උපකල්පනය පදනම් කර ගනිමින් සේවකයා සේවය කිරීම ආරම්භ කරන දින සිට මේ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

- නිශ්චිත දායකත්ව සැලසුම් - විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සේවකයන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයෝ වෙති. නිශ්චිත දායකත්ව සැලසුම්, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් ගෙවීම, දරන ලද වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති - 1 ට අනුකූල වන පරිදි සඳහන් කර ඇත.

18.5.2.2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(අගයන් ආසන්නතම රුපියලට වටයා ඇත.)

| | සටහන් | 2014 | | 2013 | |
|---|---|---|---|---|---|
| | | රුපියල් | | රුපියල් | |
| වත්කම් | | | | | |
| ජංගම වත්කම් | | | | | |
| බඩු ලේඛන/තොග | 1 | 1,518,453 | | 1,488,233 | |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් | 2 | 44,268,789 | | 33,850,731 | |
| පූර්ව ගෙවීම් | 3 | 1,122,813 | | 716,687 | |
| මුදල් සහ මුදල් සමාන දේ | 4 | 47,789,945 | 94,700,000 | 33,110,432 | 69,166,083 |
| ජංගම නොවන වත්කම් | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 5 | 373,673,224 | | 136,533,337 | |
| සිදු කරමින් පවතින කටයුතු | | | | | |
| ගොඩනැගිලි | | 51,816,438 | | | |
| ආයෝජන | 6 | 110,393,688 | 535,883,350 | 92,897,489 | 229,430,826 |
| මුළු වත්කම් | | | 630,583,350 | | 298,596,909 |
| වගකීම් | | | | | |
| ජංගම වගකීම් | | | | | |
| ගෙවිය යුතු මුදල් | 7 | 33,461,106 | | 8,474,857 | |
| උපචිත වියදම් | 8 | 17,845,279 | 51,306,385 | 18,513,569 | 26,988,426 |
| ජංගම නොවන වගකීම් | | | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 22,202,558 | 22,202,558 | 19,460,473 | 19,460,473 |
| මුළු වගකීම් | | | 73,508,943 | | 46,448,899 |
| ශුද්ධ වත්කම් | | | 557,074,407 | | 252,148,010 |
| ශුද්ධ වත්කම්/සම කොටස් | | | | | |
| ප්‍රාග්ධනය | 9 | | 555,260,549 | | 234,095,922 |
| සමුච්චිත අරමුදල | 10 | | (6,829,328) | | 9,817,515 |
| සීමිත අරමුදල | 11 | | 8,643,186 | | 8,234,573 |
| මුළු වත්කම්/සම කොටස් | | | 557,074,407 | | 252,148,010 |

18.5.3. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

(අගයන් ආසන්නතම රුපියලට වටයා ඇත.)

| | සටහන් | 2014 රුපියල් | | 2013 රුපියල් | |
|---|---|---|---|---|---|
| ආදායම | 12 | | | | |
| රජයේ ප්‍රදාන | | 50,000,000 | | 47,570,000 | |
| වෙනත් ආදායම් | | 166,415,127 | 216,415,127 | 158,754,139 | 206,324,139 |
| වත්කම් ක්‍රමක්ෂය කිරීම | | | 10,398,675 | | 8,994,552 |
| | | | 226,813,802 | | 215,318,691 |
| වියදම | | | | | |
| පුනරාවර්තන වියදම් | 13 | | | | |
| පුද්ගල පඩිනඩි | | 83,850,623 | | 64,435,311 | |
| ගමන් වියදම් | | 8,632,373 | | 7,617,735 | |
| සැපයුම් | | 7,403,596 | | 8,209,462 | |
| නඩත්තු කටයුතු | | 2,923,260 | | 2,192,803 | |
| ගිවිසුම්ගත සේවා | | 21,014,609 | | 14,164,743 | |
| වෙනත් පුනරාවර්තන වියදම් | | 56,372,401 | | 41,526,394 | |
| පශ්චාත් උපාධි පුහුණු වියදම් | | 15,700,120 | 195,896,982 | 34,424,005 | 172,570,453 |
| පාරිතෝෂික | | 3,357,858 | | 1,948,020 | |
| ක්ෂය කිරීම් | | 33,504,447 | 36,862,305 | 30,468,899 | 32,416,919 |
| ආදායමට වැඩි වියදම් අතිරික්තය | | | (5,945,485) | | 10,331,319 |

18.5.4. 2014 වසර සඳහා මූල්‍ය වාර්තාව

| ආදායම් සහ වියදම් | 2013 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| ආදායම | | |
| පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා ගමන් වියදම් ප්‍රදානය ද ඇතුළත්ව පුනරාවර්තන වියදම සඳහා රජයේ ප්‍රදානය | 47,570,000 | 50,000,000 |
| පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය මගින් උත්පාදනය කරන ලද ආදායම | 159,034,701 | 166,651,219 |
| | 206,604,701 | 216,651,219 |
| වත්කම් අපහරණය කිරීම | (280,562) | (236,092) |
| | 206,324,139 | 216,415,127 |
| වත්කම් ක්‍රමක්ෂය කිරීම | 8,994,552 | 10,398,675 |
| | 215,318,691 | 226,813,802 |
| අඩු කළා - වියදම් | | |
| පුනරාවර්තන වියදම් | | |
| පුද්ගල පඩිනඩි | 64,435,311 | 83,850,623 |
| ගමන් වියදම් සහ සංයුක්ත දීමනා | 7,617,735 | 8,632,373 |
| සැපයුම් | 8,209,462 | 7,403,596 |
| නඩත්තු කටයුතු | 2,192,803 | 2,923,260 |
| ගිවිසුම්ගත සේවා | 14,164,743 | 21,014,609 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 41,526,394 | 56,372,401 |
| පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා ගමන් වියදම් ප්‍රදානය | 34,424,005 | 15,700,120 |
| | 172,570,453 | 195,896,982 |
| පාරිතෝෂිකය | 1,948,020 | 3,357,858 |
| ක්ෂය කිරීම් | 30,468,899 | 33,504,447 |
| | 204,987,372 | 232,759,287 |
| අතිරික්තය/(හිඟය) | 10,331,319 | (5,945,485) |
| ප්‍රාග්ධන ප්‍රදානය | | |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ නඩත්තුව | 2,400,000 | 2,000,000 |
| පරීක්ෂණාගාර, ඉගැන්වීම් හා කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ | 3,500,000 | 4,000,000 |
| පුස්තකාල ග්‍රන්ථ හා වාරසඟරා | 5,600,000 | 20,000,000 |
| මෝටර් වාහන | 9,150,000 | -- |
| රොඩ්නි වීදිය ව්‍යාපෘතිය සඳහා ඉඩම | | 240,000,000 |
| නව ගොඩනැගිල්ල රොඩ්නි වීදිය ව්‍යාපෘතිය | | 53,550,000 |
| | 20,650,000 | 319,550,000 |
| ප්‍රාග්ධන වියදම් | | |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ නඩත්තුව | 1,212,488 | 981,344 |
| පරීක්ෂණාගාර, ඉගැන්වීම් හා කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ | 12,940,574 | 5,067,857 |
| පුස්තකාල ග්‍රන්ථ හා වාරසඟරා | 14,299,638 | 13,687,150 |
| මෝටර් වාහන | 9,990,000 | |
| රොඩ්නි වීදිය ව්‍යාපෘතිය සඳහා ඉඩම | | 240,000,000 |
| නව ගොඩනැගිල්ල රොඩ්නි වීදිය ව්‍යාපෘතිය | -- | 9,160,500 |
| | 38,442,700 | 268,896,851 |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව

## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊසී/සී/පීජීඅයිඑම්/1/14/එෆ්ඒ
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2015 සැප්තැම්බර් 18 දින

Postgraduate Institute of Medicine University of Colombo
01 OCT 2015
Director's Office

DB – BOM
1st

අධ්‍යක්ෂ,

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය නියමාවලියේ 20 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

Postgraduate Institute of Medicine University of Colombo
01 OCT 2015
Accounts Branch

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන )

පිටපත් :- 1. සභාපති , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2. ලේකම් , උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය
3. ලේකම් , මුදල් අමාත්‍යාංශය
4. උපකුලපති , කොළඹ විශ්වවිද්‍යාලය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**

**AUDITOR GENERAL'S DEPARTMENT**


මගේ අංකය / எனது இல. / My No. } ඊසී/සී/පීජීඅයිඑම්/1/14/එෆ්ඒ  ඔබේ අංකය / உமது இல. / Your No. }  දිනය / திகதி / Date } 2015 සැප්තැම්බර් 18 දින

අධ්‍යක්ෂ,

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය නියමාවලියේ 20 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ **2014** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත **2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ **107(5)** උපවගන්තිය සහ **18** වන වගන්තිය යටතේ පනවා ඇති 1980 අංක **01** දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154 (1)** ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ **108(2)** උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2015 මැයි 25 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 **විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා **1971** අංක **38** දරන මුදල් පනතේ 13 වගන්තියේ **(3)** සහ **(4)** උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව සම්පත් පාලනය කිරීමේ හැකියාව, අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලාඒම මත වත්කම් ලෙස ගතහැකි අතර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල පිහිටි රූඩ් 02 පර්චර්ස් 1.5 ක් වූ ඉඩමේ අයිතිය ආයතනය සතුව නොතිබුණද තක්සේරුකර මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආයතනයේ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ආකෘතිය අනුව ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

නෝවිජියන් අරමුදලේ ආයෝජන ආදායම් ගිණුම්ගත කිරීම සම්බන්ධව නිශ්චිත ගිණුම් ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ලැබූ ආයෝජන ආදායම් රු.1,359,621 ක් වර්ෂයේ ආදායම් ප්‍රකාශනය බැරකර තිබූ අතර රු.262,500 ක් නෝවිජියන් අරමුදලට බැර කර තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ පසුගිය වර්ෂයේ රු.980,000 ක් වූ මූල්‍ය නොවන ගැලපීම් ද මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ රු. 2,325 ක් වූ අදාල නොවන අරමුදල් ගලායාමක්ද සාවද්‍ය ලෙස සටහන් කර තිබුණි.

**2.2.4 නොසැසඳුනු පාලන ගිණුම්**

--------------------------------

නෝර්වීජියානු අරමුදල් ව්‍යාපෘතිය යටතේ මිලට ගෙන තිබූ ස්ථාවර වත්කම් වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු.18,707,876 ක් වූ අතර ආයතනයේ වාර්තා අනුව එය රු.19,359,465 ක් වූයෙන් රු.651,589 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ලබාගත් සේවා වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ගිවිසුම් ප්‍රකාරව රඳවාගත් මුදල් නිදහස් කිරීමෙන් තොරව රු.109,239 ක මුදල් වසර 02 සිට වසර 06 දක්වා කාල පරාසයක් රඳවාගෙන තිබු බව නිරීක්ෂණය විය.

(ආ) සෞඛ්‍ය අමාත්‍යංශය හා රාජ්‍ය බැංකුවකින් ලැබිය යුතු රු.8,405,718 ක මුදලක් වසර 02 ක සිට වසර 06 ක් දක්වා කාලයක් අයනොවී පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ආයතනය විසින් සේවකයන් සඳහා ලබාදුන් ණය මුදල් ඔවුන් විශ්‍රාම යාමට පෙර අයකරගත යුතු වුවත් සේවකයන් දෙදෙනෙකුගෙන් ලැබිය යුතු රු.7,514 ක මුදල 2008 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය | |
| (i) | X පරිච්ඡේදයේ 1.6 හා XX පරිච්ඡේදයේ 3.3, 3.5 වගන්ති | පරිපාලන ලේඛන නඩත්තු කළ යුතු වුවත් පේරාදෙනිය ප්‍රාදේශීය පුස්තකාලයේ පැමිණීමේ හා නිවාඩු ලේඛන, බැහැරයාමේ ලේඛන ක්‍රමවත් ලෙස පවත්වා නොතිබුණු අතර නිවාඩු ලබාගැනීමේදී පොදු 125 ආකෘති පත්‍ර ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන සියළුම නිළධාරීන් පැමිණීමේ හා පිටවීමේ වේලාවන් ලේඛනයේ සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 7 දෙනෙකුගේ පැමිණීම පිටවීම සටහන් කිරීමකින් තොරව එකතුව රු.8,284,331ක වැටුප් සහ දීමනා ගෙවා තිබුණි. |
| (iii) | X වන පරිච්ඡේදයේ ii වන කොටසේ 27.4 | විදේශ අධ්‍යයන නිවාඩු අනුමත කරගත යුතු වුවත් 2013 අගෝස්තු 15 දින සිට 2014 අගොස්තු 14 දක්වා කාලසීමාව සඳහා ලබාගත් විදේශ අධ්‍යයන නිවාඩු 2015 මැයි 20 වන දින වන විටත් අනුමත කරගෙන නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/ 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 394 (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.453,541 ක් වූ අවලංගු කරන ලද චෙක්පත් 649 ආදායමට ගෙන නොතිබූ අතර එම ශේෂය ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර තිබුණි. |

| | |
|---|---|
| (ඈ) 2002 පෙබරවාරි 19 දිනැති අංක පීඊඩී/ 33 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව රු.95,883,688 ක් ආයෝජනය කර තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

---

3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, **2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,945,485 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,331,319 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.16,276,804 කින් පිරිහීම සඳහා පුනරාවර්තන වියදම් රු.23,326,529 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3.2 අරමුදල් ඌන උපයෝජනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව දූරස්ථ අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ලබා දී තිබූ රු.7,168,536 ක අරමුදලින් රු.4,982,803 ක් වැය කර නොතිබුණු අතර එය සියයට 69 ක අරමුදල් ඉතිරියක් වූයෙන් එම අරමුදල් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදවා නොතිබුණි.

(ආ) ආයතනයේ සංවර්ධන අරමුදලේ රු.260,563 ක ශේෂය වසර 07 කට වැඩි කාලයක් හා පර්යේෂණ හා ප්‍රකාශන අරමුදලේ රු.4,000,000 ක ශේෂය 2013 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2015 මැයි 15 වන විටත් ඌන උපයෝජිතව පැවතුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---

4.1 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පේරාදෙණිය ප්‍රාදේශීය පුස්තකාලයේ ප්‍රයෝජනයට ගැනීමකින් තොරව පරිගණක මධ්‍යම සැකසුම් ඒකක 02 ක් (CPU 02), මොනිටර් 03 ක් සහ ස්කැනර් යන්ත්‍රයක් මාස 15ක කාලයක සිට නිෂ්ක්‍රියව පැවතුණි.

**4.2** පුස්තකාල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පේරාදෙණිය ප්‍රාදේශීය පුස්තකාලයේ සාමාජිකත්වය ලැබූ වෛද්‍යවරුන්ට පොත් බැහැර ගෙන යාම සඳහා දිනයක කාලයක් ලබාදී තිබුණද එකතුව රු.236,988 ක් වටිනා පොත් 11 ක් මාස 01 සිට මාස 14 දක්වා කාල පරාසයක් තුළ ආපසු භාර නොදී පැවති බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) නියැදි පරීක්ෂාවට අනුව වෛද්‍යවරුන් විසින් රු.7,500 ක තැන්පතුවකට යටත්ව සති 02 ක කාලසීමාවකට බැහැර ගෙන යන ලද රු.325,751 ක් වටිනා පොත් 13 ක් විගණිත දිනය වූ 2015 මාර්තු 02 වන දින වන විටත් ආපසු භාරදී නොතිබූ අතර ප්‍රමාද කාලය සති 15 සිට සති 116 දක්වා වන බව නිරීක්ෂණය විය.

**4.3** හඳුනාගත් පාඩු

පේරාදෙණිය ප්‍රාදේශීය පුස්තකාලයට පරිත්‍යාග ලෙස ලැබුණු වටිනාකම හඳුනා නොගත් පොත් 03 ක් හා වටිනාකම රු.49,894 ක් වූ පොතක් අස්ථානගතවී තිබුණි.

**4.4** කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ආයතනය විසින් කාර්යය පැවරුම් පදනම මත බඳවාගෙන සේවයේ යොදවා සිටි නිලධාරීන් 10 දෙනෙකු වෙනුවෙන් විශ්වවිද්‍යාල සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් නොගෙවීම නිසා සේවකයාගේ දායකත්වය රු.506,795 ක් සහ අධිභාර රු.748,763 ක්ද සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ අධිභාර රු.506,795 ක්ද වශයෙන් එකතුව රු.1,762,353 ක් ආයතනයේ අරමුදලින් ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ආයතනය විසින් පශ්චාත් උපාධි පාඨමාලා 65 ක් මෙහෙයවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ පමණක් රු.146,490,708 ක ආදායමක් උපයා ඇති අතර ඒ ඒ පාඨමාලා සඳහා වූ ආදායම් හා වියදම් සැලකිල්ලට ගෙන කාර්යසාධනය ඇගැයීමට සුදුසු පිරිවැය ගිණුම්කරණ ක්‍රමයක් හඳුන්වාදීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අයවැය ලේඛනමය පාලනය

ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා සඳහා අයවැය ලේඛනය පිළියෙල කර ඊට අදාළ අනුමැතිය ලබාගත යුතු වුවත් විගණනයේදී පරීක්ෂා කළ පාඨමාලා 22ක නියැදියෙන් පාඨමාලා 11 ක අයවැය ලේඛන පිළියෙල කර නොතිබූ අතර පිළියෙල කරන ලද පාඨමාලා 10 ක අයවැය ලේඛන සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) තොග පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) පුස්තකාල පරිපාලනය
(ඈ) මූල්‍ය පාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

# Postgraduate Institute of Medicine

University of Colombo, Sri Lanka

*fessor H. Janaka de Silva*
)Phil(Oxon),FRCP,FCCP,FNAS(SL)
**:ctor**

AB/C/GA/2014

2015/10/19

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

**කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සදහා වූ මූල්‍ය ප්‍රකාශන පිලිබදව 1980 අංක 01 දරණ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඒවා ඇති අංක ඊසී/සී/පීජීඅයිඑම්/1/14/එෆ්ඒ හා 2015 සැප්තම්බර් 29 දිනැති විගණන විමසුම් වාර්තාව සම්බන්ධයෙන් ගන්නා ලද හා ගැනීමට යෝජිත පියවරයන් මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

H. J. de Silva

අධ්‍යක්ෂ,
වෛද්‍ය විද්‍යා පශ්චත් උපාධි ආයතනය

Professor H. Janaka de Silva
MD. DPhil.(Oxon.) FRCP
Director
Postgraduate Institute of Medicine
University of Colombo.

eneral Office: 160, Prof. Nandadasa Kodagoda Mawatha, Colombo 07, Sri Lanka. Tel: +94 11 2697758/2696261/2681052 Web: www.pgim.cmb.ac.lk

irector
el :+94 11 2688649
ax :+94 11 2697757
mail: director@pgim.cmb.ac.lk

Academic Branch
Tel: +94 112687806/2687511
Fax: +94 11 2687050
academic@pgim.cmb.ac.lk

Exam. Branch
Tel: +94 11 2683467/2696258
Fax: +94 11 2687803
exam@pgim.cmb.ac.lk

Library
Tel: +94 11 2671047
Fax: +94 11 2687050
library@pgim.cmb.ac.lk

Medical Education Resource Centre
Tel: +94 11 2689266
Fax: +94 11 2689268
merc@pgim.cmb.ac.lk

**2.2.1** <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති</u>

විගණන විමසුම හා එකඟ වෙමි.

(අ) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීම සඳහා තක්සේරු වාර්තාවක් ඉල්ලා ලිපි යොමු කරන ලදී. ඒ අනුව තක්සේරු වටිනාකම ලබා ගත් වහාම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය නිවැරදි කර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

2.2.2 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

ආයතනයේ පවත්වාගෙන යනු ලබන සියලුම පර්යේෂණ ආධාර සඳහා වෙනමම පර්යේෂණ ගිණුමක් පවත්වාගෙන යනු ලැබේ. එබැවින් එම ගිණුම යටතේ නෝර්වීජියානු ගිණුමේ කටයුතු ද පවත්වාගෙන යෑමට කටයුතු කර ඇති අතර විමසුමෙහි සඳහන් ආදායම් සම්බන්ධව පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

මෙම ආයතනයේ සියලු ආයෝජන ආදායම් පශ්චාත් උපාධි ආයතනය උපයන ආදායම් ගිණුමෙහි ගිණුම් ගත කරනු ලැබේ. NOMA ව්‍යාපෘතියට අදාලව සියලු පොදුකාර්ය පිරිවැය ආයතනය විසින් දරනු ලබන බැවින් ආයෝජන ආදායම් ආයතනයේ ආදායම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත.

**2.2.3** <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

විගණන විමසුම හා එකඟ වෙමි.
ඉදිරියේදී මෙම මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ ක්‍රියාකාරකම් ගැලපීම් ඉදිරියේදී නිවැරදිව කිරීමට කටයුතු කරමි.

**2.2.4** <u>නොසැසඳුනු පාලන ගිණුම්</u>

මූල්‍ය ප්‍රකාශන අනුව හා ස්ථාවර වත්කම් වටිනාකම අතර වෙනස වන රු 651,589 පිලිබඳව නොපමාව පරීක්ෂා කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.

**2.3** <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

විගණන විමසුම හා එකඟ වෙමි.

(අ) සේවා සැපයීම වෙනුවෙන් රඳවාගත් මුදල් නැවත ගෙවීම සඳහා ලිඛිතව එම ආයතන වෙත දන්වා ඇති අතර මෙහි සඳහන් ආයතන විසින් මෙතෙක් ඒ සඳහා ප්‍රතිචාර දක්වා නොමැත. එබැවින් 2008 – 2012 දක්වා සඳහන්ව ඇති ආයතන වලට අදාළ වටිනාකම් සඳහා ආදායමට ගැනීමට මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ අධ්‍යක්ෂ ජනරාල් වෙත සිහිකැඳවීම් ලිපි යවා ඇති අතර රු.5,953,375 මුදලක් 02/10/2015 දින ආයතනය වෙත ලබා ගැනීමට කටයුතු කර ඇත.

(ඇ) මෙම ආයතනයෙන් ස්ථාන මාරු වී ගොස් ඇති එන්.ඒ.විතානගේ මහත්මිය ස්ථාන මාරු වූ අවස්ථාවේදී අදාළ විශ්ව විද්‍යාල වෙත මෙම මුදල් අයකර ගැනීම සඳහා දැනුම් දී ඇත.තවද අර්ථසාධක අරමුදල් නිදහස් කිරිමේදී මෙම මුදල් අප ආයතනය වෙත එවන ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙතද ලිඛිතව දැනුම් දී ඇත.

එම්.ඊ.ජී.එන්.සමරවීර මහතාගේ අර්ථසාධක අරමුදල් මෙතෙක් නිදහස් කර නොමැති බැවින් මෙම මුදල අර්ථසාධක අරමුදලෙන් අඩුකර අප ආයතනය වෙත එවන ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත මීට පෙර දන්වා ඇති අතර නැවතත් ලිඛිතව දැනුම් දෙන ලදී.

## 2.4 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

විගණන විමසුම හා එකඟ වෙමි.

(අ)

I. නිවාඩු ලබා ගැනීමේදී සියලුම නිලධාරීන් කල් ඇතුව නිවාඩු ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර අනුමත කිරීමෙන් පසු ලිපිගොනුගත කරනු ලැබේ.සඳහන් කල දිනයන්හි නිවාඩු ඉල්ලුම් පත් නිසි පරිදි ගොනු ගත කර නොතිබුණි.ඒවා ලිපි ගොනුගත කිරීමටත් මින් ඉදිරියේදී එම අඩුපාඩු මගහරවා ගැනීමටත් උපදෙස් දී ඇත.

II. විශ්ව විද්‍යාල පද්ධතිය තුළ සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පැමිණීම හා පිටවීම සටහන් කරනු නොලැබේ. එහෙත් ඔවුන්ගේ රාජකාරි ලැයිස්තු වල සඳහන් සියළු අධ්‍යයන හා පරිපාලන කාර්යභාරයන් නිසියාකාරව ඉටුකරනු ලැබේ. මේ සම්බන්ධව නිසි ක්‍රමවේදයක් දැනට විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක නොවන බැවින් පැමිණීම හා පිටවීමේ වෙලාවන් සටහන් කිරීම සම්බන්ධව කටයුතු කරනු නොලැබේ.

III. විදේශ අධ්‍යයන නිවාඩු ලබා අධ්‍යන කටයුතු සඳහා ගොස් ඇති වෛද්‍ය පී.ඒ. සිරිවර්ධන මහතාගේ නිවාඩු 15.08.2012 සිට 14.08.2013 දක්වා අනුමත වී ඇත. තවද, වෛද්‍ය සිරිවර්ධන මහතා හට කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ ආවරණ අනුමැතිය යටතේ මෙම නිවාඩු ලබා දී ඇත.

තවද, 15.08.2013 සිට 14.08.2014 දක්වා කාලයට අදාල නිවාඩු දීර්ඝ කර ගැනීම සඳහා ඉල්ලීමේ ලිපියක් 12.08.2013 දාතමින් යවා ඇති අතර වාචිකවද සිහිගැන්වීම් කර ඇතත් මේ දක්වා ඒ සඳහා පිළිතුරක් ලැබී නොමැත. ඒ අනුව ඉහත කාලසීමාවට (15.08.2103 සිට 14.08.2014) අදාළව අධ්‍යන නිවාඩු දීර්ඝ කර ගැනීම සඳහා ලිපියක් නැවතත් යැවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අයි එ අයි 2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇතත් විගණන විමසුමෙහි සඳහන් මෘදුකාංග ඇතුළත් වී නොතිබු බැවින් එම මෘදුකාංග ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුළත් කර යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී.

(ඇ) 2014 දෙසැම්බර් 31 වෙනි දිනට අවලංගු චෙක්පත්ලාභීන්ට ඒ සම්බන්ධව දැනුම් දී නොතිබු බැවින් ආදායමට ගැනීමට නොහැකි විය. 2015 වසරේ සිට මුල්‍ය රෙගුලාසි 394 (ඇ) ප්‍රකාරව අවලංගු කරන ලද චෙක්පත් වටිනාකම ආදායමට බැර කිරීමටත් මාස 6 ඉක්මවූ චෙක්පත් ලාභීන්ට සිහිකැදවීමේ ලිපි යැවීමටත් කටයුතු කර ඇත.

(ඇ) ආයෝජනය කර ඇති රු. 95,883,688 ක් වු ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට ලිපි යවා ඇතත් මෙතෙක් ඒ සඳහා පිළිතුරු ලැබී නොමැත. එසේ වුවද නැවතත් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීම පිණිස ලිපි යැවීමට කටයුතු කර ඇත.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

(අ) දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාප්තිය සඳහා 2007 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා රු 7,168,536 ක අරමුදලක් ලැබී ඇති අතර වැයකළ මුළු ප්‍රදාන වටිනාකම රු 6,185,753 කි.මෙම අරමුදල පවත්වාගෙන යනු ලබන්නේ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයේ පර්යේෂණ ගිණුම යටතේ ය. එම ගිණුමේ 2010 වර්ෂයේ අප්‍රියෙල් මාසයේ රු 8,306,694 ක මුදල් ශේෂයක් තිබී ඇති අතර එම ශේෂයෙන් රු 4,000,000 ක ස්ථාවර තැන්පතු ආරම්භ කර ඇත.

(ආ) ආයතනයේ සංවර්දන අරමුදල දැනට ක්‍රියාත්මක නොවන බැවින් මේ පිලිබඳව කළමනාකරණ මණ්ඩලය දැනුවත් කර තීරණයක් ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි.

2013 වර්ෂයේ රු 4,000,000 ක මුදලක් මාරු කරමින් පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල් ආරම්භ කර ඇත. මේ වන විට ඉමම අරමුදල ක්‍රියාත්මක වී නොමැති අතර මේ පිලිබඳව කළමනාකරණ මණ්ඩලයෙන් උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කරමි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

(අ) විමසුමෙහි සදහන් පරිගණක මධ්‍ය සැකසුම් ඒකක 02, මොනිටර් 03 සහ ස්කෑනර් යන්ත්‍රය මේ වන විට පේරාදෙණිය පුස්තකාලයේ පාවිච්චිය සදහා යොදාගෙන ඇත.

### 4.2 පුස්තකාල පරිපාලනය

(අ) මෙම තත්ත්වය දීර්ඝ කාලයක සිට පවත්වාගෙන එනු ලබන සේවාවක් බැවින් අදාල ලිඛිත අනුමැතියක් සොයාගත නොහැකිවිය. මේ පිලිබදව පුස්තකාල කමිටුව දැනුවත්කර අදාල අනුමැතියන් ලබා ගැනීමට කටයුතු කරමි. නියමිත දිනයේදී භාර නොදෙන පොත් සදහා ගතයුතු ක්‍රියාමාර්ග පිලිබදව පුස්තකාල කමිටුවේ නිර්දේශයන් මත තීරණයක් ගැනීමට කටයුතු කර ඇත.

(ආ) රු.7500ක මූල්‍ය තැන්පතුවකින් පසු පොත් බැහැර ගෙන යාමට අවසර ලබාදීම පුස්තකාල කමිටු තීරණයකින් අනුමත වූවකි.නමුත් රු. 7500 ට වැඩ අඩු පොත් පුස්තකාලය තුල දුබල වීමත් වෛද්‍යවරුන් මූල්‍ය තැන්පතුව තබන්නේ ඔවුන්ගේ අවශ්‍යතාවයේ උපරිමය නිසාමත් මිල පරික්ෂා කිරීමකින් තොරව පොත ලබා දීමට කටයුතු කර ඇත.රු. 7500 ට වඩා වැඩි වටිනාකමෙන් යුතු පොත් බැහැර ගෙනයාමට අවසර දීමේදී ගතයුතු ක්‍රියාමාර්ග පිලිබදව පුස්තකාල කමිටුවේ නිර්දේශයක් ඉදිරියේදී ලබා ගැනීමටත් ආපසු පොත් භාරදීම ප්‍රමාද කරනු ලබන සාමාජිකයන්ගෙන් ප්‍රමාද ගාස්තු අයකිරිමටත් කටයුතු කරන ලදී.

**4.3** <u>හදුනාගත් පාඩු</u>

අස්ථාන ගත වූ පොත් 4 පිලිබදව පුස්තකාල කමිටුවට වාර්තා කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යොදා ඇත.

**4.4** <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) මින් ඉදිරියේදී සේවක අර්ථසාධක අරමුදල් සදහා අදාළ නීතිරීති අනුව කටයුතු කරමි.

**5** <u>**ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**</u>

විගණන විමසුම හා එකඟ වෙමි.

**5.1** <u>අයවැය ලේඛනමය පාලනය</u>

පිළියෙල කරන ලද සියළුම අයවැය ලේඛණ අධ්‍යයන කමිටු හා මුදල් කමිටු නිර්දේශය ලබාගත් වහාම කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමුකිරීමට කටයුතු කරනු ලැබේ. දැනටමත් අනුමැතිය ලබා නොමැති අයවැය ලේඛණ අදාළ අධ්‍යයන මණ්ඩල වෙත සහ මුදල් කමිටුව වෙත ඉදිරිපත්කර ඇති අතර ඉදිරියේදී ද සියළු පාඨමාලාවන්ට අදාළ අයවැය ලේඛණ සඳහා ද අනුමැතිය ලබාගැනීමට කටයුතු සකස්කර ඇත.

අධ්‍යක්ෂ
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය